# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1877/25 - 2014 අගෝස්තු මස 27 වැනි බදාදා - 2014.08.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

LA/1023

### 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය, දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන වන මම, එකී මණ්ඩලයට බලංගොඩ ජල සම්පාදන ක්‍රමයේ ජල මූලාශ්‍රය හා ජල ටැංකිය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය.

2014 අගෝස්තු මස 25 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1079.

#### උපලේඛනය

රත්නපුර දිස්ත්‍රික්කයේ, බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කිරිදිගල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ඇල්ලවත්ත ගමේ පිහිටි බැංකියාවත්ත නැමති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් අක්කර 02 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස.

| | | |
|---|---|---|
| *උතුරට* | : | වලවේ ගඟ ; |
| *නැගෙනහිරට* | : | ඉඩමේ ඉතිරි කොටස ; |
| *දකුණට* | : | අ.ග.පි 470 අතිරේක 02 කැබලි අංක 77 ; |
| *බටහිරට* | : | වලවේ ගඟ පාලම. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : 01. ඩබ්. බී. එම්. ධර්මරත්න බණ්ඩාර බස්නායක
නො. 93, ඔරේන්ජ් හිල්,
කල්තොට පාර,
බලංගොඩ.

09 - 385

1A - G 20128 — 10 (2014/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

LA/1820

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය, දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන වන මම, එකී මණ්ඩලයට මහනුවර දකුණ ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ වෙලම්බඩ බූස්ටර් පොම්පාගාරය ඉදිකර ඇති ඉඩම අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය.

2014 අගෝස්තු මස 25 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.
5/2/2/1081.

**උපලේඛනය**

මහනුවර දිස්ත්‍රික්කයේ, උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 106 කුරදෙණිය ග්‍රාම නිලධාරී වසමේ, කුරදෙණිය ගමේ පිහිටි මෙගොඩ ගලපිට ගෙදර කුඹුරේ වත්ත නැමති ඉඩමේ සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 01 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස.

| | | |
|---|---|---|
| *උතුරට* | : | ප්‍රධාන මාර්ගයේ සිට නිවාස වලට වැටී ඇති ප්‍රාදේශීය සභා මාර්ගය ; |
| *නැගෙනහිරට* | : | ප්‍රධාන මාර්ගයේ සිට නිවාස වලට වැටී ඇති ප්‍රාදේශීය සභා මාර්ගය හා මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *දකුණට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *බටහිරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස හා නිල නිවාස වලට වැටී ඇති මාර්ගය. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය :* 01. ඩබ්. එම්. උපාලි විජේසුන්දර,
141/B, උඩගොල්ල වත්ත,
කුරදෙණිය,
වෙලම්බඩ.

09 - 386

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.